ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2005

කම්කරු නීතිය – LWU 3323 / 4314 / 4323

කාලය - පැය තුනයි

---

දිනය: 2006 අප්‍රේල් මස 26 වන දින වේලාව: ප. ව. 1.30 සිට ප.ව. 4.30 දක්වා

---

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න
අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

1. "පොදු නීතිය යටතේ ස්වාමියා හා සේවකයා අතර පැවති සම්බන්ධතාව ව්‍යවස්ථාපිත සබඳතාවක් බවට වෙනස් වී ඇත".

   ඔබ ඉහත ප්‍රකාශය සමග එකඟ වන්නෙහි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

2. කුලී රථ සේවාවක් පවත්වාගෙන යන රෝයි සහ සමාගම වරුණ එහි රියදුරෙක් ලෙස සේවයේ යොදවයි. වරුණට නිත්‍ය මාසික වැටුපක් නොගෙවනු ලබන අතර ඔහුට ගෙවනුයේ දිනයේ උපයනු ලබන සම්පූර්ණ ආදායමින් 1/3 ක් පමණි. සමාගමේ ඇඳුම් පැළඳුම් රීති අනුව වැඩ කරනු ලබන පැය ගණන තුළ දී වරුණ කමිසයක් සහ ටයි පටියක් පැළඳ සිටියි.

   සමාගම සහ වරුණ අතර පවතින ගිවිසුම මගින් වරුණ කිසිම ස්ථානයක කවර හෝ ආකාරයකින් සේවය කිරීම ප්‍රකාශිතව තහනම් කරනු ලැබ ඇත. වරුණ සමාගමේ සේවයෙන් ඉවත් වී හෝ ඔහුගේ ගිවිසුම සමාගම විසින් අවසන් කරනු ලැබීමෙන් වසර තුනක් ගත වනතෙක් වරුණට කුලී රථ රියදුරකු වශයෙන් සේවය කළ නොහැකි බවට ද ගිවිසුම සඳහන් කරයි. ගිවිසුමේ අවසන් කොන්දේසිය මගින් සේවා ගිවිසුමක් යටතේ වරුණ ස්වාධීන ගිවිසුම්කරුවකු වන බව ද සඳහන් කරයි.

   වරුණ සමග පවතින ගිවිසුම අවසන් කිරීමට රෝයි සහ සමාගම අදහස් කරයි. සේවා ගිවිසුම යටතේ වරුණ සේවකයෙක් ද යන්න සාකච්ඡා කරන්න.

3. (අ) කාර්මික ආරවුල පණත යටතේ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා සතු බලතල පැහැදිලි කරන්න.

   (ආ) එක්ස් සහ සමාගම විසින් 2005 ජනවාරි මස 01 දින සිට අනිල් ලිපිකරුවකු වශයෙන් සේවයේ යොදවනු ලැබිය. සමාගම විසින් අනිල් වෙත පත්වීමේ ලිපියක් නිකුත් නොකරනු ලැබිය. ඔහුට රු 10,000/- ක මාසික වැටුපක් ගෙවන ලදී. සමාගමේ ලිපිකාරිණියකට කරදර කිරීම සම්බන්ධයෙන් සමාගම විසින් 2006 මාර්තු මස 18 වන දින දී අනිල්ගේ සේවය අවසන් කරන ලදී. සේවය අවසන් කිරීම පළිගැනීමක් බවට අනිල් පැමිණිලි කරයි.

සිය සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් තමාට කිසියම් සහනයක් ලබා ගත හැකි දැ යි අනිල්ට උපදෙස් දෙන්න.

4. කාර්මික ආරවුල පණතේ විධිවිධාන සහ විනිශ්චිත නඩු තීරණ ඇසුරෙන් කම්කරු නීතියේ 'සාධාරණ සහ යුක්තිසහගතබව' පිළිබඳ සංකල්පය පැහැදිලි කරන්න.

5. "ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ හා ළමුන්ගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා ව්‍යවස්ථාදායකය විසින් සෑම උත්සාහයක්ම ගෙන ඇත".

ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යවස්ථා ඇසුරෙන් ඉහත ප්‍රකාශය පිළිබඳව අදහස් දක්වන්න.

6. "වැඩවර්ජනය කිරීමේ අයිතිය පූර්ණ අයිතියක් නොවේ".

අදාල ව්‍යවස්ථා කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව පැහැදිලි කරන්න.

7. (අ) අදාල ව්‍යවස්ථා කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ පාරිතෝෂික ගෙවීම පිළිබඳ නීතිය පැහැදිලි කරන්න

(ආ) සිය ව්‍යාපාර කටයුතු ආරම්භ කළ 1995 වර්ෂයේ පටන් නිමල් සහ සමාගම විසින් සේවකයන් 15 දෙනෙකු සේවයේ යොදවා ඇත. පසුගිය වසර 6 ක කාලයක් තිස්සේ සමාගමේ සේවය කළ මනෝජ් සමාගමෙන් ඉවත් වී යාමට තීරණය කරයි.

(i) පාරිතෝෂිකය සඳහා තම හිමිකම පිළිබඳව මනෝජ්ට උපදෙස් දෙන්න.

(ii) මුදල් අයථා පරිහරණය කිරීම සම්බන්ධයෙන් සමාගම විසින් මනෝජ්ගේ සේවය අවසන් කරනු ලැබුයේ නම් ඔබේ පිළිතුර වෙනස් වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

8. පහත සඳහන් දෑ අතුරින් ඕනෑම දෙකක් පිළිබඳ සටහන් ලියන්න.

(අ) සේවකයන් අඩු කිරීම පිළිබඳ නීතිය
(ආ) සාමූහික ගිවිසුම් පිළිබඳ නීතිය
(ඇ) පරිවාසිකයෙකුගේ රැකියා සුරක්ෂිතභාවය
(ඈ) සාප්පු සහ කාර්යාල සේවකයන්ගේ පණතේ සුවිශේෂී ලක්ෂණ